PMoE Sabaragamuwa

සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவமாகாணசபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்விதகவல்தொழில்நுட்பம்மற்றும்கலாச்சாரநடவடிக்கைகளுக்கானஅமைச்சு

Ministry of Education, Information Technology & Cultural Affairs

Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015 Residence – 045 2232985

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number – MEDU/AD/15/01/මා.ම./ 2026-27

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2026.07. 01

---

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,සබරගමුව පළාත,
සබරගමුව පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සබරගමුව පළාත් පාසල්වල සියලුම විදුහල්පතිවරුන්,
සබරගමුව පළාත් පාසල්වල සියලුම ගුරුභවතුන්,

## වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2026/2027

සබරගමුව පළාතේ පළාත් පාසල්වල සේවය කරන ගුරුභවතුන්ගේ 2026/27 වර්ෂයට අදාළව වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් (අධ්‍යාපන කලාප තුළ/අන්තර් කලාප/අන්තර් පළාත්) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ යටතේ සබරගමුව පළාත් සභාවට අයත් පාසල්වල 2026.12.31 දිනට සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ කරනු ලබන සෑම ගුරුභවතෙකුම ස්ථාන මාරු අයදුම්කල යුතු අතර, එසේ අයදුම්පත් ඉදිරිපත් නොකළහොත් සබරගමුව පළාතේ ඕනෑම ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමති සේ සලකා ක්‍රියා කිරීමට සිදුවනු ඇත. එසේ නමුත් සේවා කාලය වසර 03 සම්පූර්ණ කරන ලද අති දුෂ්කර පාසල්වල හා වසර 04 ක සේවා කාලයක් සම්පූර්ණ කළ දුෂ්කර පාසල්වල ගුරුවරුන්ටද ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

03. **වර්තමාන පාසලේ සේවා කාලය වසර 05 කට වඩා වැඩි අන්තර් කලාප හෝ අන්තර් පළාත් ස්ථාන මාරුවීම සඳහා අයදුම් කරන ගුරුභවතුන් එම ස්ථාන මාරු නිර්දේශ ක්‍රියාත්මක වන තෙක් අධ්‍යාපන කලාපය තුළ ස්ථාන මාරු සඳහා යටත් වේ.**

04. අධ්‍යාපන කලාප තුළ සහ අන්තර් කලාප/අන්තර් පළාත් ගුරු ස්ථාන මාරුවීම් 2027.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

05. එසේම මෙවර වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම **EMIS දත්ත පද්ධතිය හරහා (https://hrm.emis.moe.gov.lk/login) මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් සිදුකරනු** ලබන බැවින් ස්ථාන මාරු අපේක්ෂා කරන සෑම ගුරුභවතෙකුම ඒ සම්බන්ධයෙන් ලබා දෙන ලද උපදෙස්වලට (ඇමුණුම 01) අනුකූලවම පමණක් අයදුම්කල යුතුය. මාර්ගගත ක්‍රමය (Online) යටතේ සකස් කර ඇති අයදුම්පත්‍රය හැර වෙනත් කිසිදු ගුරු ස්ථානමාරු අයදුම්පත් ආකෘතියක් අයදුම් කිරීම සඳහා භාවිතා නොකළ යුතු අතර, වෙනත් මුද්‍රිත ස්ථානමාරු අයදුම්පත්‍රයක් භාවිතා කළහොත් එම අයදුම්පත්‍රය ඉදිරි කටයුතු සඳහා භාවිතයට නොගන්නා බවද සැලකිය යුතුය.

### මාර්ගගත ක්‍රමය (Online) යටතේ ස්ථානමාරු අයදුම්පත් යොමුකල යුතු අනිවාර්යය කාල සීමාවන් :-

i. ගුරුභවතුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පතිවරුන් වෙත **2026.07.22** දිනට ප්‍රථම යොමු කළ යුතුය. **(මෙම කාල සීමාව ඇතුලත පමණක් මාර්ගගතව අයදුම් කිරීමට අවස්ථාව පවතින අතර,එම කාල සීමාවෙන් පසු අයදුම් කිරීමට ඇති පහසුකම අත්හිටුවනු ලබන බවද සැලකිය යුතුය.)**

ii. විදුහල්පතිවරුන්ගේ නිර්දේශ සහිත එකී අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත **2026.07.29** දිනට ප්‍රථම යොමු කළ යුතුය. **මෙම කාල සීමාව ඇතුලත පමණක් නිර්දේශ ලබා දීමට අවස්ථාව පවතින අතර, එම කාල සීමාවෙන් පසු නිර්දේශ ලබා දීමට ඇති පහසුකම අත්හිටුවනු ලබන බවද සැලකිය යුතුය.**

iii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ සහිත එකී අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් **2026.08.12** දිනට ප්‍රථම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

iv. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිර්දේශ කරන ලද එකී අයදුම්පත් **2026.08.22** දිනට ප්‍රථම පළාත් අධ්‍යාපන ලේකම් වෙත යොමු කළ යුතුය.

<u>වෙනත් විශේෂ කරුණු :-</u>

i. වාර්ෂික ගුරු ස්ථාන මාරු 2025/26 යටතේ අයදුම්කර, එහෙත් මෙතෙක් සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොලැබීම හේතුවෙන් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොවූ ගුරුභවතුන් 2026/27 වර්ෂය සඳහා ද නැවත අයදුම් කිරීම අනිවාර්යය වේ.

ii. මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථානමාරු අයදුම්පත ඉදිරිපත් කිරීමේදී අදාළ සියලු තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීම ගුරුභවතා සතු වගකීමකි. එසේ නිවැරදි තොරතුරු ඇතුලත් නොකල සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධයෙන් ගුරු මාරු මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම තීරණයකට ගුරුභවතා යටත් වන්නේය.

iii. **2026.08.23** දින සිට **2026.09.11** දින දක්වා අන්තර් කලාප සහ අන්තර් පළාත් ස්ථානමාරුවීම් වලට අදාල මාරු මණ්ඩල අවසන් කිරීමට අපේක්ෂිත අතර, එකී ගුරු මාරු මණ්ඩල තීරණවලට බාධාවක් නොවන පරිදි, ස්ථාන මාරු අපේක්ෂිත ගුරුභවතුන් විසින් ලබා දී ඇති ප්‍රමුඛතාවන් විශේෂයෙන් සැළකිල්ලට ගෙන, අධ්‍යාපන කලාපය තුළ මාරු මණ්ඩල තීරණවලට එළඹීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සතු වගකීමකි.

iv. සියළුම ගුරු මාරුවීම් වලට අදාළ මාරු මණ්ඩල තීරණ EMIS දත්ත පද්ධතිය හරහා පමණක් ගුරුභවතුන් වෙත නිවේදනය කරනු ඇත.

v. අන්තර් පළාත් ස්ථාන මාරුවීම් යටතේ ගනු ලබන්නා වූ මාරු මණ්ඩල තීරණවලට අදාළව සුදුසුකම්ලත් අයදුම්පත් සඳහා ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය වන ලිපි ලේඛන (පිරික්සුම් ලැයිස්තු ආදිය) පිළිබඳව ද ගුරුභවතුන් වෙත නිවේදනය කරනු ලබන අතර, එම නිවේදනයන්ට අනුකූලව අවශ්‍ය ලිපි ලේඛන අප්‍රමාදව සැපයීම ගුරුභවතුන් සතු වගකීමකි. ඒ සම්බන්ධයෙන් පසුව කරනු ලබන ඉල්ලීම්, අභියාචනා සැළකිල්ලට ගනු නොලැබේ.

<u>සැලකිය යුතුයි :-</u>

**වාර්ෂික ගුරු ස්ථාන මාරු 2026/27 යටතේ අයදුම්පත් කැඳවනු ලබන 2026.07.01 දින සිට ස්ථාන මාරු ක්‍රියාවලිය අවසන් වන දිනය තෙක් වාර්ෂික ස්ථානමාරු නොවන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සිදුනොකිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වගබලා ගතයුතු අතර, එවැනි ඉල්ලීම් හෝ අභියාචනා ඉදිරිපත් නොකිරීම ද ගුරුභවතුන් සතු අනිවාර්ය වගකීමකි. එසේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු නොකරන බව ද අවධාරණය කරමි.**

වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය ඵලදායිව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අගය කොට සලකන්නෙමි.

**ඩී.ඩබ්.එස්.රාජපක්ෂ,**
**ලේකම් (රා.ආ.),**
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

ඩී.ඩබ්.එස්. රාජපක්ෂ
ලේකම් (රා.ආ)
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමු පළාත් සභාව

පිටපත් :-

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැ.ගැ.ස.
2. ආණ්ඩුකාර ලේකම්, සබරගමුව පළාත. - ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කිරීම සඳහා.
3. සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - ඔබ කොට්ඨාසයේ විදුහල්පතිවරුන් මගින් සියළුම ගුරුභවතුන් අනිවාර්යයෙන් දැනුවත් කිරීම සඳහා.

ඇමුණුම 01

<u>ගුරුමාරු අයදුම්පත පිරවීම සඳහා උපදෙස්</u>

➢ ගුරුවරුන් සඳහා උපදෙස්

- **පද්ධතියට පිවිසීම**

Emis දත්ත පද්ධතියට ඇතුල්වීම සඳහා https://hrm.emis.moe.gov.lk වෙත පිවිසෙන්න.

එහි ඇති Log In මත click කිරීම මඟින් ඔබට Emis Log In Page එකට පිවිසිය හැක.

එහි E-mail තීරුවේ ඔබ විසින් පෞද්ගලික ලිපිගොනුව සඳහා ලබා දී ඇති E-mail ලිපිනය ලබා දී අනතුරුව මුරපදය ලබාදෙන්න.

පද්ධතියට ආරක්ෂිතව ප්‍රවේශ වීම සඳහා ආරක්ෂක තහවුරු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සම්පූර්ණ කරන්න.

Dashboard වෙත පිවිසීමට SIGN IN බොත්තම ක්ලික් කරන්න.

- **මුරපදය නැවත සැකසීම**

පද්ධතියට පිවිසීමේ මුරපදය ඔබ සතුව නොමැතිනම් **මුරපදය යළි සැකසීමේ පිටුව විවෘත කිරීම සඳහා** Login තීරයේ Forgot Password මත ක්ලික් කර මුරපදය යළි සැකසීමේ පිටුවට පිවිසෙන්න.

මුරපද යළි සැකසීමේ උපදෙස් ලබා ගැනීම සඳහා ඔබගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත් කරන්න.(ඔබගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයට ප්‍රවේශ විය නොහැකි නම්, කලාප අධ්‍යාපන කාර්යාලයේ Emis නිලධාරියා අමතන්න.)

ඔබගේ විද්‍යුත් තැපැල් Inbox එක පරීක්ෂා කරන්න.

විද්‍යුත් තැපැල විවෘත කර නව මුරපදයක් සෑදීම සඳහා password reset link එක ක්ලික් කර මුරපදය සකස් කර පද්ධතියට පිවිසෙන්න. (inbox හි link එක නොමැතිනම් Spam ගොනුව බලන්න.)

- **තොරතුරු පරීක්ෂා කිරීම හා නිවැරදි කිරීම**

ඔබ පද්ධතියට Log වූ පසු වම් පස ඇති My Profile මත ක්ලික් කිරීමෙන් ඔබගේ පෞද්ගලික දත්ත ඔබට බලා ගත හැකිය. එම දත්ත නිවැරදි නොවේ නම් හෝ යම් වෙනසක් සිදු කිරීමට අවශ්‍යනම් දකුණු පස ඇති **Send Edit Request** මත ක්ලික් කරන්න.

**අනතුරුව විවෘත වන කවුළුවේ ඔබට වෙනස් කිරීමට හෝ ඇතුළත් කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු එකවර ඇතුළත් කර Submit මත ක්ලික් කරන්න.**

- **ස්ථාන මාරු අයදුම් කිරීම**

ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා වම් පස ඇති My Transfer මත ක්ලික් කරන්න. එවිට විවෘත වන වෙබ් පිටුවේ සබරගමු පළාතට අදාළ ස්ථාන මාරු කවුළුව මත ක්ලික් කර Start New Application ඔස්සේ ගොස් ඔබේ අයදුම්පත යොමු කරන්න. ඔබ වෙත ලැබෙන PDF ගොනුව භාගත කර සුරැකිව තබාගන්න.

*කලාප කාර්යාලවල Emic භාර නිලධාරීන්ගේ දුරකථන අංක ඇමතීමෙන් ඔබට පද්ධතිය සම්බන්ධ ගැටලු සඳහා සහාය ලබාගත හැකිය.

| කලාපය | Emis භාර නිලධාරියාගේ නම | තනතුර | දුරකතන අංකය |
|---|---|---|---|
| රත්නපුර | ඩී.සී.ජයින්තා මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආයතන) | 071-5793901 |
| | ඒ.පී.මුණසිංහ මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(පරිපාලන) | 071-4447884 |
| | ඩබ්.කේ.එම්.අයි.පී.වීරසිංහ මිය | සංවර්ධන නිලධාරි | 070-6187677 |
| | ආර්.ඒ.එන්. එන්.රණසිංහ මිය | කළමණාකරන සේවා නිලධාරි | 071-3262387 |
| නිවිතිගල | එච්.වී.එම්.සී.හේමපාල මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආයතන) | 071-7217177 |
| | ඒ.එස්.සපරමාදු මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන) | 070-7018168 |
| | ඩබ්.සී.රණවීර මිය | සංවර්ධන නිලධාරි | 077-9444029 |
| | මහේෂ් සුගතපාල මයා | සංවර්ධන නිලධාරි | 071-5911600 |
| බලංගොඩ | විනෝත්කන්නන් මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආයතන) | 077-7549906 |
| | එම්.එස්.පී.විජේතුංග මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | 071-4965293 |
| | දේශප්‍රිය අබේකෝන් මයා | සංවර්ධන නිලධාරි | 070-2490831 |
| | ඒ.ජී.ධනුෂ්ක ලසිත ධර්මරත්න මයා | කළමණාකරන සේවා නිලධාරි | 077-814448 |
| ඇඹිලිපිටිය | කේ.කේ.එස්.දමයන්ති මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන) | 071-4621001 |
| | එන්.පී.හෙට්ටිආරච්චි මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආයතන) | 070-5565901 |
| | කේ.ජී.ටී.වී.කරුණාතිලක මයා | සංවර්ධන නිලධාරි | 071-5978960 |
| | ලක්මාලි මිය | සංවර්ධන නිලධාරි | 071-0416365 |
| දෙහිඔවිට | යූ.ඒ.ඩී.දිලූපා මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන) | 077-2255853 |
| | එම්.ජී.එස්.පිටදෙනිය මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආයතන) | 070-7722315 |
| | කේ.ජී.වී.ඒ.වයි.ඩී.විතාරණ මිය | කළමණාකරන සේවා නිලධාරි | 076-2421899 |
| | ටී.ඒ.ජී.දිල්රුක්ෂි මිය | කළමණාකරන සේවා නිලධාරි | 076-2194323 |

| | | | |
|---|---|---|---|
| කෑගල්ල | බී.කේ.එම්.එස්.ගුණරත්න මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන) | 071-4441293 |
| | එච්.ජී.ඩී.ප්‍රියන්ති මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු ආයතන) | 071-2773797 |
| | ඩී.එච්.ඒ.ඩී.එස්.නවරත්න මිය | සංවර්ධන නිලධාරි | 0775951817 |
| | පී.පී.ගුණතිලක මිය | කළමණාකරන සේවා නිලධාරි | 071-3221573 |
| මාවනැල්ල | හසන්ති සමරසිංහ මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු ආයතන) | 070-6377368 |
| | නදිශා රත්නායක මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන) | 076-8804984 |
| | එන්.ඒ.අන්සන් ෆවුස් මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු ආයතන II ) | 077-7038083 |
| | උදයංගනී මිය | කළමණාකරන සේවා නිලධාරි | 071-5645152 |

*** පහත සඳහන් කලාපීය තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථාන වෙත පැමිණීමෙන්ද ඔබට Emis පද්ධතිය සම්බන්ධ ගැටලු සඳහා සහාය ලබාගත හැකිය.**

| අනු අංකය | කලාපීය තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථානයේ නම | දුරකතන අංකය |
|---|---|---|
| 1 | අටුලුගම | 036-2268143 |
| 2 | රුවන්වැල්ල | 071-8048945 |
| 3 | කෑගල්ල | 035-2268472 |
| 4 | කුරුවිට | 045-2263438 |
| 5 | මාවනැල්ල | 035-2246110 |
| 6 | පැල්මඩුල්ල | 045-2274164 |
| 7 | නිවිතිගල | 045-2279315 |
| 8 | බලංගොඩ | 045-2288343 |
| 9 | ගොඩකවෙල | 045-2240164 |
| 10 | කොළොන්න | 045-2260985 |